## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/175/2024 (NPC)**

එච්.ජී.ලාල්

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.02.12**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

මෙම අභියාචනය 2025.08.12 දින විමසීමට ගත් අවස්ථාවේදී අභියාචක දන්වා සිටියේ ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය නිසි බලයක් නොමැතිව නිකුත් කර තිබූ හෙයින් එම නියෝගය බල රහිත වන බවයි. ඒ අනුව මෙම සිද්ධියට අදාළව නිකුත් කර ඇති නියෝගයන් බලරහිතව නිකුත් කර ඇති නියෝගයන් වන්නේද යන කරුණ පරීක්ෂාවට භාජනය කරන ලදී.

අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය අභියාචනා පෙත්සම සමඟ ඇමුණුම 05 ලෙස ඉදිරිපත් කර ඇත. එකී නියෝගය වැඩබලන පොලිස්පතිවරයා විසින් 2020.02.17 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දැනුම් දී ඇත. ඒ අනුව එකී විනය නියෝගය නිකුත් කර ඇත්තේ පොලිස්පතිවරයා විසින් බව පැහැදිළිව පෙනී යයි. මෙවැනි නියෝගයක් නිකුත් කිරීමට පොලිස්පතිවරයාට බලතල ලැබී ඇත්තේ, කුමන අන්දමට දැයි පරීක්ෂා කර බලන ලදී.

2016.05.06 දිනැතිව නිකුත් කරන ලද අංක 1965/37 දරන ගැසට් පත්‍රයේ, එක් එක් නිළයන්ට/තනතුරු වලට පවරා ඇති බලතල, වෙන් වෙන්ව සඳහන් කර ඇත. එම ගැසට් පත්‍රයේ උපලේඛනයේ I වන තීරුවේ ප්‍රථමයෙන් සඳහන් කර ඇත්තේ, ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිළයන් **"පොලිස් ස්ථානයන්හි ස්ථානාධිපතිවරුන් හැර"** යන අය සම්බන්ධයෙන් විනය නියෝග නිකුත් කිරීමට පොලිස්පතිවරයාට බලතල පවරා ඇති බවයි.

අභියාචක දන්වා සිටින්නේ, ඔහු සම්බන්ධයෙන් වන මෙම විනය නියෝගය නිකුත් කරන අවස්ථාව වන විට, ඔහු බූස්ස කඳවුරේ ත්‍රස්ත්‍ර විමර්ෂණ අංශයේ ස්ථානාධිපතිවරයා ලෙස සේවය කළ බවයි. ඉහත කී ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රෙගුලාසිවල, III වන රෙගුලාසිය අනුව පෙනී යන්නේ, ගැසට් පත්‍රයේ උප ලේඛනයේ නිශ්චිතව සඳහන් කර නැති පොලිස් නිළධාරීන් සම්බන්ධයෙන් වන බලතල පොලිස් කොමිෂන් සභාව විසින් සෘජුවම ක්‍රියාත්මක කරනු ලබන බවයි. ඒ අනුව පෙනී යන්නේ, මෙම අභියාචනයට එරෙහිව විනය නියෝගයක් නිකුත් කරන අවස්ථාව වන විට ඔහු ස්ථානාධිපතිවරයකුව සිටිමින් කටයුතු කර ඇති නිසා, විනය නියෝගය නිකුත් කිරීමේ බලධරයා වන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාව බවයි. ඒ අනුව බැලූ බැල්මට නිකුත් කර ඇති විනය නියෝගය බලයෙන් පිටතව ක්‍රියාකරමින් කරන ලද නියෝගයක් බව පෙනී යයි.

මේ අවස්ථාවේදී අභියාචනා පෙත්සම සමඟ ඇමුණුම 04 වශයෙන් ඉදිරිපත් කර ඇති ලේඛනයටද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. එම ලේඛනය, ජාතික පොලිස් කොමිෂන් සභාවේ තොරතුරු නිළධාරී විසින් අභියාචක වෙත එවන ලද 2019.07.31 දිනැති ලිපියයි. එම ලිපියෙහි III වන ඡේදයේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ, ඉහත සඳහන් අංක 1965/37 දරන ගැසට් නිවේදනය පරිදි 2017.01.26 දින සිට, පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ සහ ක්‍රියාකාරී කොට්ඨාශ භාර ස්ථානාධිපතිවරුන්ගේ විනය බලධාරීත්වය ජාතික පොලිස් කොමිෂන් සභාව සතු වන බැවින්, එම නියෝගයට පටහැනිව ස්ථානාධිපති තනතුරක් දරන නිළධාරියකුට පොලිස්පති විසින් ලබා දෙන ලද චෝදනා පත්‍රය බලරහිත වන බවයි.

එයින්ද පෙනී යන්නේ අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය බලයෙන් පිටත නිකුත් කර ඇති විනය නියෝගයක් බව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්ම පිළිගෙන ඇති බවයි. ඉහත හේතූන් සළකා බලා

අභියාචක වෙත, වැඩබලන පොලිස්පතිවරයා විසින් 2020.02.17 දිනැතිව නිකුත් කරන ලද විනය නියෝගය බලරහිතව නිකුත් කර ඇති විනය නියෝගයක් බව තීරණය කරමු. එවැනි තීරණයක් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට හැකියාවක් නැත. ඒ අනුව ඉහත සඳහන් 2020.02.17 දිනැති ලිපියෙන් අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු.

ඉහත හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/